Article 12 (1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2019-10-30 |

පැමිණිලිකාර පාර්ශවය : මොහොමඩ් රාසික් ෆාතිමා රිනෝෂා මිය,
අංක. 166/81ඒ, විහාර මාවත,
බෝගොඩවත්ත, මහනුවර

වගඋත්තරකාර පාර්ශවය : විදුහල්පති,
මහ/කිංස්වුඩ් විද්‍යාලය,
මහනුවර.

<u>පැමිණිලි අංකය : **HRC/K/615/16**</u>

**පැමිණිල්ලේ සැලකිරීම :-**

උක්ත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින් ප්‍රකාශ කර ඇත්තේ, තම දරුවා වගඋත්තරකාර මහ/කිංස්වුඩ් විද්‍යාලයේ 2017 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා 'පාසලට ආසන්න පදංචිකරුවන්ගේ දරුවන්' යන ගණය (CO-433) යටතේ අයදුම්පතක් ඉදිරිපත් කළ බවත්, නමුත් තමා පදිංචි ස්ථානයේ ඔප්පුවට හිමිකම් තහවුරු නොවීම යටතේ අයදුම්පත ප්‍රතික්ෂේප කරන ලද බවට දැන්වූ බවත්ය. තමා මේ පිළිබඳ පාසලෙන් විමසූ විට අදාළ ඔප්පුවේ හා උප්පැන්න සහතිකයේ තම මවගේ නම පරස්පර බව පැවසූ බැවින් එය සනාථ කිරීමට 2016.08.08 මවගේ දිවුරුම් ප්‍රකාශයක්ද ග්‍රාම නිලධාරි සහතිකයක්ද ඉදිරිපත් කරන ලද බවත් සඳහන් කර ඇත.

මහ/කිංස්වුඩ් විද්‍යාලය තම නිවසේ සිට දම්වැල් 10 ක් පමණ දුරින් පිහිටා ඇති අතර, තම දරුවාට නිවසේ සිට පාසලට පා ගමනින් යාමට හැකි බවත්, වෙනත් පාසලකට යන්නේ නම් මහ/කිංස්වුඩ් පාසල පසුකර යා යුතු බවත්, තමාගේ මවගේ නමෙහි ඇති පරස්පරතාවය නිවැරදි කිරීමට අවශ්‍ය සියළු ලේඛන ඉදිරිපත් කර සිටි නමුත් මෙතෙක් දරුවා පාසලට ඇතුළත් කරගැනීමට කටයුතු කර නොමැති බවත් සඳහන් කර ඇති අතර මේ පිළිබඳව සොයා බලා සාධාරණයක් ඉටුකර දෙන ලෙසට කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

වගඋත්තර පාර්ශවීය සැලකිරීම් :-

පැමිණිල්ලට අදාළ වගඋත්තරකාර මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිෂන් සභාව වෙත කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාරියගේ දරුවා 2017 වර්ෂයේ පළමු වසරට ඇතුළත් කිරීමට අදාළව පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බවත්, නමුත් ඇයගේ පදිංචිය සනාථ කිරීමට ඉදිරිපත් කළ ඉඩම් ඔප්පු පරීක්ෂාවේදි එය තුවාන් හැරිස් නෝනා ජෙමිලා යන අයට හිමි බව නිරීක්ෂණය වූ බවත්, ඉල්ලුම්කාරිය අයදුම්පත සමඟ ඉදිරිපත් කර ඇති ඇයගේ උප්පැන්න සහතිකයේ මවගේ නම නෝනා ජෙමිලා යනුවෙන් සඳහන් බැවින් එකී වෙනස හේතුවෙන් අයදුම්පත මූලික පරීක්ෂණයේදීම ප්‍රතික්ෂේප කළ බවත් ය.

විමර්ශන හා පරීක්ෂණ කටයුතු වලදී අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලිකාරිය සිය දරුවා 2017 වර්ෂයේ මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ 1 වන වසරට ඇතුළත් කර ගැනීම සඳහා පාසලට ආසන්න පදිංචිකරුවනගේ දරුවන් ගණය යටතේ අයදුම් කර ඇති අතර, සම්මුඛ පරීක්ෂණය මණ්ඩලය විසින් පැමිණිලිකාරියගේ පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු නොවන බව දන්වා සම්මුඛ පරීක්ෂණයට නොකැඳවා අයදුම්පත ප්‍රතික්ෂේප කර ඇත. 2017 වර්ෂයේ පාසැල්වල පළමු ශ්‍රේණියට ළමයින් ඇතුලත් කර ගැනීමේ අංක 17/2016 දරණ චක්‍රලේඛනයෙහි අයදුම්කරුවකුගේ පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු නොවේ නම් අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොමැත.

සම්මුඛ පරීක්ෂණයට අයදුම්කරු කැඳවූයේ නම් පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු නොකිරීම මත අදාළ ලකුණු ප්‍රමාණය අහිමි වුවද ඉතිරි ලකුණු ප්‍රමාණය පැමිණිලිකාරියට ලබාගත හැකිව තිබූ නමුත් වගඋත්තරකරුවන් විසින් එම අවස්ථාව අහිමිකර ඇති බව නිරීක්ෂණය වේ.

එක් නිර්ණායකයක් සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම මත අනෙක් නිර්ණායක සඳහා ලකුණු ලබා දීම ප්‍රතික්ෂේප කළ නොහැකි බවට <u>වෙනුර නන්විද සහ එස්.ටී කොඩිතුවක්කු</u> එරෙහිව <u>බී.ඒ අබේරත්න, විදුහල්පති, කොළඹ රාජකීය විද්‍යාලය SCFR 62/2018</u> නඩුවෙහිදී තහවුරු කර ඇති අතර, එහිදී පදිංචිය සනාථ කිරීමට නොහැකිවීම පදනම් කරගෙන ඉතිරි නිර්ණායක සඳහා ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම තුළින් පෙත්සම්කරුට අසාධාරණයක් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව ප්‍රකාරව මූලික අයිතිවාසිකම් කඩකිරීමක් සිදුකර ඇති බවට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රකාශ කොට ඇත.

තවද, **<u>පුෂ්පරාජන් රොහාන්</u>** එදිරිව **<u>කාරිවසම් SCFR 06/2017</u>** නඩුවේදීද පදිංචිය සනාථ කිරීම සඳහා අවශ්‍ය ලේඛන අතරින් එක් ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ පමණින්, ඒ මත ඉතිරි නිර්ණායක සඳහා ලකුණු ලබා නොදීමට පාසල ගත් තීරණය අත්තනෝමතික බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කොට ඇත.

මෙම සමස්ත කරුණු අනුව වගඋත්තර පාර්ශවීය මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලි පාර්ශවයට අගතියක් කර ඇති බව පැහැදිලිව පෙනි යයි.

පැමිණිලිකාරිය විසින් පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති මවට අයත් ඔප්පුවේ සහ පැමිණිලිකාරියගේ අයදුම්පත සමඟ ඉදිරිපත් කර ඇති ඇයගේ උප්පැන්න සහතිකයේ මවගේ නමෙහි වෙනසක් පවතින බැවින් අයදුම්පත ප්‍රතික්ෂේප කර ඇති බව වගඋත්තර පාර්ශවීය මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිසම වෙත දන්වා ඇතත්, නමෙහි පවතින පරස්පරතාවය පිළිබඳ දිවුරුම් ප්‍රකාශයක් මඟින් නිවැරදි කරගැනීමට නීතිමය හැකියාව තිබියදී අයදුම්පත ප්‍රතික්ෂේප කිරීම මඟින් පැමිණිලි පාර්ශවයට අගතියක් සිදුකර ඇති බව තවදුරටත් පෙනි යයි.

**නිගමනය :-**

වගඋත්තර පාර්ශවීය මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණය මණ්ඩලය 17/2016 චක්‍රලේඛනයට පටහැනිව පැමිණිලිකාරියගේ දරුවා ඇතුළත් කර ගැනීමට ඉදිරිපත් කළ අයදුම්පත ප්‍රතික්ෂේප කිරීම මඟින් පැමිණිලිකාරියට තම දරුවා අදාල පාසලට ඇතුලත් කර ගැනීමට තිබූ අවස්ථාව අහිමි කිරීම හේතුවෙන් පැමිණිලිකාරියට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති සර්ව සාධාරණයේ මූලික අයිතිය උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව පැමිණිලිකාරිය විසින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කර ඇති අනෙකුත් ලේඛන සඳහා හිමිවිය යුතු ලකුණු ප්‍රමාණය ලබා දී එම ලකුණු අනුව පැමිණිලිකාරිය කඩඉම් ලකුණු සීමාව කරා ප්‍රවිශ්‍ය වන්නේ නම් පැමිණිලිකාරියගේ දරුවා වගඋත්තරකාර මහ/කිංස්වුඩ් විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණියකට ඇතුළත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

2019. 11 . 29 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාරිය විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත් :- 1. අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මහතා,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

2. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

B/ R-4